# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2012 ජුලි මස 02 වන සඳුදා

## බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.49 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මුලාසනාරූඩ විය.

**පැමිණීම :**

| | |
|---|---|
| ගරු අයි.ඒ. සුනිල් විජේරත්න | (ගරු සභාපතිතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති සහ වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා) |
| ගරු ජගත් අංගගේ | (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල | (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභානායකතුමා) |
| ගරු මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අමරසේකර, ශිරන්ත
අම්ජාඩ්, එම්.එම්.එම්.
අල්මේදා, මහේෂ්
අබේරත්න, පී.ඩී.
උඩවත්ත, කීර්ති
උඳුගොඩ, ප්‍රදීප්
එල්ලාවල, ලලිත්
කහටපිටිය, කිත්සිරි
කාරියවසම්, ලයනල්
කුමරගුරුබරන්.එන්
කුමාර, ජගත්
කුරුප්පු, කාමල්
කුරුවිටගේ, මහින්ද
කුලරත්න, ලාල්
කොටකදෙණිය, එච්.එම්.පී.බී.
කෝරළගේ, යසපාල
ගුණසේකර, වික්‍රම්
චන්ද්‍රභානු, අදිකාරම්ගේ
චන්ද්‍රරත්න, නිමල්
ජයකොඩි, සිසිර
ජයනාත්, ගුණසිරි
ජයවර්ධන, නිහාල්
තිලකරත්න, හෂාන්
තිලකසිරි, ගාමිණී
ද සිල්වා, අනන්ද හරිශ්චන්ද්‍ර
ද සිල්වා, ගාමිණී
ද සිල්වා, ජයන්ත
ද සිල්වා, පියල් නිශාන්ත
ද සිල්වා, සිරිකමල් ෆිලිෂියන්
ද සිල්වා, සේනක දමයන්ත
ද සොයිසා, විජයමුණි සුමිත්
දේවප්‍රිය, ඉසුර
නිසාම්ඩීන්, එම්. අර්ෂාඩ්
පියනන්ද ස්ථවිර, පූජ්‍ය තෙබුවන
පෙරේරා, අ.ශ්‍රීනාත් ම.
පෙරේරා, දයාකාන්ත
පෙරේරා, පෝල්
පෙරේරා, මෙරිල්
ප්‍රනාන්දු, කිත්සිරි
ප්‍රනාන්දු මැතිනිය, රෝස්
බෙත්මගේ, හෙක්ටර්
මතුගමගේ, සුගත්
මල්ලව, නෙලුක්
මවුජුඩ්, අජ්මාල්
මාන්නප්පෙරුම, අජිත්
මැන්දිස්, සුමිත් ලාල්
යුසුෆ්, ඒ.එම්.
රහීම් එම්.එස්.එම්.
රහුමාන්, මොහොමඩ් මුජිබූර්
රාජකරුණා, හර්ෂන
රාජපක්ෂ, තිලකරත්න
රාජපක්ෂ, දිලිප් කුමාර
රාජේන්ද්‍රන්, එස්.
රාම්, පංචරත්නම්
රූපසිංහ, ආනන්ද රංජිත්
ලක්තිලක, ශිරාල්
ලංකාතිලක මැතිනිය, අශෝකා
වර්ණකුමාර, ලලිත්
වරාගොඩ, රෙහෙන්සිරි
වැලිවත්ත, ජනක් දීපාල්
විජේරත්න, මොරිස්
සුමනසේකර, සරත් කුමාර
සූරියබණ්ඩාර, ජානක
සෙනෙවිරත්න, රොජර්
ෆායිස් මොහොමඩ්

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු නිමල් ලාන්සා | (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

කාරියවසම්, කීර්ති
කොස්තා, ජේම්ස් ප්‍රිමිලස්
ගමගේ, සලෝචන
ගුණරත්න, උපාලි
ගුණවර්ධන මැතිනිය, කෝකිලා හර්ශිනි
ජයකොඩි, චන්දන
ජයතිස්ස, නලින්ද
ජයසිංහ,ලයනල්
පතිරණ, සරත්
පීරිස්, නිමල් ආර්
පාදුක්ක, නිරෝෂන්
පෙරේරා, තුෂාර
පෙරේරා, ප්‍රදීප්
පෙරේරා, ශ්‍රීනාත්
ප්‍රියන්ත, විජිත්
මංචනායක, කිත්සිරි
රාජපක්ෂ, වරුණ දීප්ති
රොද්‍රිගු, රන්දීර්
වනිගරත්න, ලලිත්
විජේමාන්න, ලක්ෂ්මන්
විජේරත්න, උදේන
විජේසුන්දර, ශාලිත
විජේසේකර, රවී
සකළසූරිය මැතිනිය, චන්ද්‍රිකා ගුණවර්ධන
සිරිවර්ධන මැතිනිය, සන්ධ්‍යා
සිල්වා, අමල්
ෆයිරූස්,මොහොමඩ්
ෆවුසි එම්. නවුසර්

## 01. නිවේදන :

*i*

*"ඉඩම් සංවර්ධන ආඥා පනත (464 පරිච්ඡේදය) සංශෝධනය කිරීමට අදාළව අතිගරු ජනාධිපතිතුමා විසින් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත එවා ඇති පනත් කෙටුම්පත හා ඒ පිළිබඳ නව යෝජනා ඇතුළත් ලේඛනය බස්නාහිර පළාතේ ගරු වැඩ බලන ආණ්ඩුකාරතුමිය විසින් මා වෙත යොමු කර ඇති අතර,*

*එම පනත් කෙටුම්පත පිළිබඳව පළාත් සභාවේ අදහස් අතිගරු ජනාධිපතිතුමා වෙත දැන්වීම සඳහා 2012.07.06 දිනට ප්‍රථම ගරු ආණ්ඩුකාරතුමා වෙත ලබා දෙන ලෙස දන්වා තිබෙන අතර, අද දින නියමිත වැඩ කටයුතුවලදී ඒ සඳහා ප්‍රමුඛතාව ලැබෙන බවත් ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.*[1]

*ii*

*"පෞද්ගලික වෛද්‍ය උපාධි ආයතනය සම්බන්ධව 2012.06.05 දින පැවැති සභා රැස්වීමේදී සංශෝධන සහිතව සභා සම්මත වූ යෝජනාව, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. ලිපි ලේඛන පිළිගැන්වීම :

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත හා ඊට අමුණා ඇති සෙසු ලේඛන සභාවට පිළිගන්වන ලදී.

## 03. කාරක සභා වාර්තා පිළිගැන්වීම :

2012.06.20 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

## 04. නොපැමිණ සිටීමේ අවසරය :

*"නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමාට මාස තුනක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි"* මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.

***පූ.භා. 10.25 ට පළාත් සභාව තාවකාලිකව අත් හිටුවන ලදින්, පූ.භා. 11.20 ට යළිත් රැස් විය.***

## 05. රීති අංක 107 යටතේ යෝජනාව :

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ (3) අනු ව්‍යවස්ථාව යටතේ ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත හා ඒ පිළිබඳ නව යෝජනා ඇතුළත් ලේඛනය පිළිබඳව පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කරනු පිණිස අතිගරු ජනාධිපතිතුමා විසින් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කරනු ලැබ ගරු වැඩ බලන ආණ්ඩුකාරතුමිය විසින් ගරු සභාපතිතුමා වෙත යොමු කරනු ලැබ ඇති හෙයින්ද, ගරු වැඩ බලන ආණ්ඩුකාරතුමියගේ නියමය පරිදි 2012.07.06 දිනට පෙර පළාත් සභාවේ අදහස ගරු වැඩ බලන ආණ්ඩුකාරතුමිය වෙත දන්වා යැවීම කළ යුතු හෙයින්ද, මතු දැක්වෙන යෝජනාව ඉදිරිපත් කර එම පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කිරීමට හැකි වනු පිණිස අද දින (2012.07.02) මෙම සභාවේදී එම වැඩ කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී, රීති අංක 8(5), 8(6), 15(1), 15(4), 57(1), 57(2), 57(3), 57(4), 57(5), 63අ(1), 63අ(2), 63අ(3) හා 88(2) හි විධිවිධානයන් අත්හිටුවා ක්‍රියා කළ යුතු යැයි" සභා රීති අංක 107 (1) හි විධිවිධාන යටතේ යෝජනා කරමි.*

## 06. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : ඉඩම් සංවර්ධන ආඥා පනත් (සංශෝධන) කෙටුම්පත සලකා බැලීම

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලදී.

*"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 154 උ (3) අනු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුව, ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත (ඒ පිළිබඳ නව යෝජනා ඇතුළත් ලේඛනයද සමග) අතිගරු ජනාධිපතිතුමා විසින්, බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කිරීම සඳහා බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කරනු ලදුව, ගරු වැඩ බලන ආණ්ඩුකාරතුමිය විසින් ගරු සභාපතිතුමා වෙත යොමු කර ඇති හෙයින්ද, එකී අනු*

---

[1] 2012.07.02 දින නිල වාර්තාවේ පිටු අංක 01 බලන්න.

*ව්‍යවස්ථාවේම විධිවිධාන අනුව, එම යොමු කිරීම ලද දින සිට දින 21 ක් ඇතුළත අදහස් ප්‍රකාශ කර එවන ලෙසට දන්වා ඇති හෙයින්ද, එකී පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කර, මෙම පළාත් සභාව තීරණය කරනු ලබන පරිදි සභාවේ එකඟතාවය අතිගරු ජනාධිපතිතුමා වෙත යැවීම පිණිස ගරු ආණ්ඩුකාරතුමා වෙත යැවිය යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.***

***පූ.භා. 11.35 ට පළාත් සභාව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 12.11 ට යළිත් රැස් විය.***

***අනතුරුව, 2008 සැප්තැම්බර් මස 01 වන දින ගැසට් කරන ලද ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතේ වගන්ති, අනු වගන්ති සහ උප වගන්ති අනුපිළිවෙළින් විමසන ලදුව, මතු පළ වන ආකාරයට පළාත් සභාවේ එකඟතාව ලැබිණ.***

***ඊට අනුකූලව, පනත් කෙටුම්පතේ 1 වැනි වගන්තිය විමසන ලදුව, සභාව එකඟ වූයෙන්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පතේ 2 වැනි වගන්තිය විමසන ලදුව, පහත සඳහන් සංශෝධනය යෝජනා විය. එනම්,***

*"ඉඩම් සංවර්ධන ආඥා පනතේ ඉඩම් කොමසාරිස් ලෙස ඇති සෑම තැනකම ඉඩම් කොමසාරිස් ජනරාල් ලෙස දැක්වීම සහ පළාත් සභාවලට පැවරී ඇති බලතල සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස්."* යනුවෙන් ඇතුළත් කළ යුතු බව පිළිබඳ,

***ප්‍රශ්නය විමසන ලදින්, සංශෝධිතාකාරයෙන් සභා සම්මත විය.***

***පනත් කෙටුම්පතේ 3 වැනි වගන්තිය විමසන ලදුව, පහත සඳහන් සංශෝධනය යෝජනා විය. එනම්,***

*"ඉඩම් සංවර්ධන ආඥා පනතේ ඉඩම් කොමසාරිස් ලෙස ඇති සෑම තැනකම ඉඩම් කොමසාරිස් ජනරාල් ලෙස දැක්වීම සහ පළාත් සභාවලට පැවරී ඇති බලතල සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස්."* යනුවෙන් ඇතුළත් කළ යුතු බව පිළිබඳ,

***ප්‍රශ්නය විමසන ලදින්, සංශෝධිතාකාරයෙන් සභා සම්මත විය.***

***පනත් කෙටුම්පතේ 4 වන වගන්තිය විමසන ලදුව, සභාව එකඟ වූයෙන්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පතේ 5 වන වගන්තිය විමසන ලදුව, පහත සඳහන් සංශෝධනය යෝජනා විය. එනම්,***

*"කලින් සංශෝධන ලෙස ඉදිරිපත් වූ දෙවැනි සහ තුන්වැනි වගන්තිවලට ගැළපෙන පරිදි ඉඩම් කොමසාරිස්වරුන්, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන්, සහකාර ඉඩම් කොමසාරිස්වරුන් සහ පළාත් සභාවලට පැවරී ඇති බලතල සම්බන්ධයෙන් පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන් සහ පළාත් සහකාර ඉඩම් කොමසාරිස්වරුන්."* යනුවෙන් ඇතුළත් කළ යුතු බව පිළිබඳ,

***ප්‍රශ්නය විමසන ලදින්, සංශෝධිතාකාරයෙන් සභා සම්මත විය.***

***ඊට අනුකූලව, පනත් කෙටුම්පතේ 6 වන වගන්තිය විමසන ලදුව, සභාව එකඟ වූයෙන්, සභා සම්මත විය.***

***ඊට අනුකූලව, පනත් කෙටුම්පතේ 7 වන වගන්තිය විමසන ලදුව, සභාව එකඟ වූයෙන්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පතේ 8 වන වගන්තිය විමසන ලදුව, පහත සඳහන් සංශෝධනයන් යෝජනා විය. එනම්,***

*"ප්‍රධාන ප්‍රඥප්තියේ vii පරිච්ඡේදයෙන් ඉක්බිතිව පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය වශයෙන් ඇතුළත් කරනු ලැබ ඇති viii වන පරිච්ඡේදය වන දීමනා පත්‍ර අවලංගු කිරීම යන පරිච්ඡේදයෙහි 88 වශයෙන් අංකනය වී ඇති ඡේදයෙහි 28 වෙනි පේළියෙහි සහ අදාළ සංශෝධිත පනත් කෙටුම්පතෙහි 4 වන පිටුවෙහි 1 සහ 2 පේළිවලත් 4 සහ 6 පේළිවලත් 4 සහ 5 පේළිවලත් ඇති "ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා" යන වචන වෙනුවට අවස්ථානුකූලව පළාත් ඉඩම් කොමසාරිස්වරයා හෝ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වශයෙන් සංශෝධනය විය යුතු බවටත්,*

*එම වගන්තිය යටතේම 4 වන පිටුවට ඇතුළත් 90(1) වශයෙන් අංකනය කොට ඇති ඡේදයේ ඇති 11 සහ 12 පේළිවල සහ 90 (3) වශයෙන් අංකනය කොට ඇති ඡේදයෙහි 31 වන පේළියේ ඇති ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා යන වචනය වෙනුවට අවස්ථානුකූලව පළාත් ඉඩම් කෙමසාරිස්වරයා හෝ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා බවට සංශෝධනය විය යුතු බවටත්,*

*8 වන වගන්තිය යටතේම සංශෝධිත පනත් කෙටුම්පතෙහි 5 වන පිටුවේ 91 වශයෙන් අංකනය කොට ඇති ඡේදයේ 9 සහ 10 පේළිවල ඇති ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා යන වචන වෙනුවට අවස්ථානුකූලව පළාත් ඉඩම් කොමසාරිස්වරයා හෝ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා යනුවෙන් සංශෝධනය විය යුතු බවටත් 8 වන වගන්තිය යටතේම සංශෝධිත පනත් කෙටුම්පතේ 5 වන පිටුවේ*

*92 වගයෙන් අංකනය කොට ඇති ජේදයේ ඇති 15 සහ 17 පේළිවල ඇති ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා යන වචන වෙනුවට අවස්ථානුකූලව පළාත් ඉඩම් කොමසාරිස්වරයා හෝ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා"* යනුවෙන් සංශෝධනය වීමෙන්,

***ප්‍රශ්නය විමසන ලදින්, සංශෝධිතාකාරයෙන් සභා සම්මත විය.***

***පළාත් කෙටුම්පතේ 9 වන වගන්තිය විමසන ලදුව, පහත සඳහන් සංශෝධනය යෝජනා විය. එනම්,***

***පළාත් කෙටුම්පතේ 9 (1) උප වගන්තිය යටතේ ඇති ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උප ලේඛනය යටතේ දක්වා ඇති, vi බෑණලා සහ ලේලිලා යන්නට පසුව ඇති ජේදය එනම්, එසේ වුවද, යන්න සිට නොලැබේ යන්න දක්වා වු ජේදය සඳහා පහත සංශෝධනය ඉදිරිපත් විය. එනම්,***

*"පසු උරුමය නම් නොකරන අවස්ථාවේ වැඩිමහල් පිරිමි දරුවාට හෝ එවැන්නෙක් නොමැති විටක ඊළඟ පිරිමි දරුවාට වශයෙන් පිරිමි පාර්ශවයට ලබා දී ඇති ප්‍රමුඛත්වය වෙනස් කර සමානව දරුවන් ලෙස සංශෝධනය කිරීම සහ ඉඩම් සංවර්ධනය කර ගෙන සිටින දරුවාට ප්‍රමුඛත්වය ලබා දීම."*

***අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින්, සංශෝධිතාකාරයෙන් සභා සම්මත විය.***

***පළාත් කෙටුම්පතේ 9 (2) වගන්තිය විමසන ලදුව, පහත සඳහන් සංශෝධනයන් යෝජනා විය. එනම්,***

*"සංශෝධිත පළාත් කෙටුම්පතේ 9 (2) උප වගන්තියට අදාළ ජේදයේ 30 වන පේළියේ "තැනැත්තෙකු" යන වචනයට ඉක්බිතිව "හෝ තැනැත්තන්" අදාළ පළාත් පාලන ආයතනයේ අවම බෙදුම් ඒකකයට යටත්ව යනුවෙන් ඇතුළත් කිරීමෙන්ද එහි 32 වන පේළියේ "තීරණය වන්නේය" යන වචන අවසානයට, "එසේ වුවද ප්‍රාදේශීය ලේකම්ගේ තීරණයෙන් අතෘප්තියට පත් වන පාර්ශවයනට දින 42 ක කාලයක් තුළදී ලිඛිත පෙත්සමකින් තම අභියාචනය අන්තර් පළාත් වාරිමාර්ග ඉඩම් සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාටද සෙසු ඉඩම් සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස්වරයාටද ඉදිරිපත් කළ හැකි වන අතර ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය"* යනුවෙන් සංශෝධනය වීමෙන් ඇතුළත් විය යුතු බව යෝජනා කරන ලදුව,

***ප්‍රශ්නය විමසන ලදින්, සංශෝධිතාකාරයෙන් සභා සම්මත විය.***

***පළාත් කෙටුම්පතේ 10 වන වගන්තිය විමසන ලදුව සභාව එකඟ වුයෙන්, සභා සම්මත විය.***

***අනතුරුව, ඉඩම් සංවර්ධන ආඥා පනත් (සංශෝධන) කෙටුම්පතට නව වගන්තියක් ලෙස, පළාත් ඉඩම් කොමසාරිස් යන්න අර්ථ කථනය වීමෙන් පැහැදිලි කිරීමක් ඇතුළත් කළ යුතු බව යෝජනා කරන ලදුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 07. කල් තැබීම :

එවලේ අපරභාග 01.00 පසු වුයෙන්, ගරු සභාපතිතුමා විසින් සභාව කල් තබන ලදි.

***පළාත් සභාව, අ.භා. 01.09 ට, 2012 ජුලි මස 17 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2012.07.02
බස්නාහිර පළාතේ පළාත් සභාව,
සභා ලේකම් කාර්යාලය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

පුර්/02
 FILENAME Minuts 2012.07.02 - Hansard Section